## 2018.09.13 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

**<u>පැමිණීම</u>**

1 ගරු සභාපති කේ.වි. සුසන්ත පෙරේරා මහතා
2 ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා
3 ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා
4 ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5 ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6 ගරු මන්ත්‍රී යූ. ජූඩ් එම්මානුවෙල් මහතා
7 ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8 ගරු මන්ත්‍රී කේ .නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9 ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10 ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා
11 ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
12 ගරු මන්ත්‍රී ඒ. රෙක්සි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13 ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා
14 ගරු මන්ත්‍රිනි ජී. ලීනා ප්‍රියන්ගිකා පෙරේරා මහත්මිය
15 ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය
16 ගරු මන්ත්‍රී කේ. නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
17 ගරු මන්ත්‍රිනි අයි. නයෝමි රම්‍යාලතා මහත්මිය
18 ගරු මන්ත්‍රී ඩබ්.ඒ. රෙන්ෆ්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා
19 ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මයා
20 ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මයා
21 ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
22 ගරු මන්ත්‍රී එච්.ඒ. සී.පෝල් පෙරේරා මහතා
23 ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා
24 ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා
25 ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා
26 ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
27 ගරු මන්ත්‍රී බී. ඇන්ටනි සුනිල් ශාන්ත පෙරේරා මහතා
28 ගරු මන්ත්‍රී ඩබ්. සුරේන් ඇන්ටන් ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
29 ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය
30 ගරු මන්ත්‍රිනි පී.එම්. ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය

31 ගරු මන්ත්‍රිනි එම්. එම්. මේරි වාලට් කුරේ මහත්මිය

32 ගරු මන්ත්‍රිනි ඩබ්. දූලක්ෂි චමෝදරි ප්‍රනාන්දු මෙනවිය

33 ගරු මන්ත්‍රිනි ආර්.පි. නදීකා රණවිර මහත්මිය

34 ගරු මන්ත්‍රී වි.ඒ. වර්ණරංග ගුණසේකර මහතා

35 ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා

36 ගරු මන්ත්‍රිනි ඒ.එම්. චමිලා දිල්රුක්ෂිකා මහත්මිය

37 ගරු මන්ත්‍රී එම්.පි.ඩි. උදේෂ් තරංග කරුණාරත්න මහතා

38 ගරු මන්ත්‍රී ටි.බි.ඩි. ඇන්ටනි කුමාර් මහතා

39 ගරු මන්ත්‍රී වි.කේ.එම්. අසන්ත කුලසේකර මහතා

40 ගරු මන්ත්‍රී එස්.එම්. දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා

මෙදින පෙ.ව 10.00 ට මහ සභා රැස්විමේ කටයුතු ගරු සභාපති කේ.වි. සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා රැස්විම් ශාලාවේ දී ආරම්භ විය.

ගරු උපසභාපතිතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිවරියන් ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි.

## 01. 2018.08.09 දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම

17 පිටුවේ, 10 දෙවන ඡේදය "මේවන විට වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ වැව් නවීකරණය කිරීම අවිධිමත් ලෙස සිදු වනවා සේම, 2017 වසරේදී ලුණුවිල සොයිසා වැව නවීකරණය කිරීමේදී ද ගම්වාසින්ගේ විරෝධය නොතකමින් වැව සොරොව්වේ අඩිය මට්ටමටත් වඩා ගැඹුරු කිරීමේදී අප විසින් පෙන්වා දුන් පරිදි වැවේ ප්‍රධාන බැම්ම ශක්තිමත් කිරීමකින් තොරව ඉවත් කළ සියළු පස් විකුණා දැමීම හේතුවෙන් මේ වන විට වැවේ ප්‍රධාන බැම්මෙන් ජලය කාණ්දු වීමට පටන් ගෙන ඇති බවත්, දැනට වැවේ ජලය පිරී ඇති බැවින්, එම වැව් බැම්ම නවීකරණය කර ගැනීමට නොහැකිව වැලි කොට්ට යොදා තාවකාලික විසඳුම් ලබා දී ඇති බවත් පවසන ලදී." යනුවෙන් නිවැරදි විය යුතු බවට ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදි.

ඉහත සංශෝධන සහිතව 2018.08.09 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

i. පෞද්ගලික කටයුත්තක් මත අද දින මහ සභා රැස්වීම සඳහා සහභාගී වීමට නොහැකි බව ගරු මන්ත්‍රී එල්. දිනේෂ් චන්දන පෙරේරා මහතා විසින් දන්වා එවා ඇත. 2018.09.13 දිනට නිවාඩු අනුමත කරමි.

ii. ගරු මන්ත්‍රී එල්. දිනේෂ් චන්දන පෙරේරා මහතාගේ 2018.09.10 දින සිට 2018.09.17 දක්වා ඉල්ලා ඇති විදේශ නිවාඩු අනුමත කරමි.

iii. අසනීප තත්වයක් මත අද දින මහ සභා රැස්වීම සඳහා සහභාගී වීමට නොහැකි බව ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා විසින් දන්වා එවා ඇත. 2018.09.13 දිනට නිවාඩු අනුමත කරමි.

iv. අසනීප තත්වයක් මත අද දින මහ සභා රැස්වීම සඳහා සහභාගී වීමට නොහැකි බව ගරු මන්ත්‍රී ආර්.පී. අකිල ශිරංග රාජපක්ෂ මහතා විසින් දන්වා එවා ඇත. 2018.09.13 දිනට නිවාඩු අනුමත කරමි.

v. නොලැක්විය හැකි හේතුවක් නිසා අද දින මහ සභා රැස්වීම සඳහා සහභාගී වීමට නොහැකි බව ගරු මන්ත්‍රී එච්. ඒ. විමල් රෝහිත සුසන්ත පෙරේරා මහතා විසින් දන්වා එවා ඇත. 2018.09.13 දිනට නිවාඩු අනුමත කරමි.

vi. 2018.10.05 වන සිකුරාදා දින උදෑසන 8.30 සිට සවස 3.00 දක්වා යෝගියාන ජයසුන්දරාරාම විහාරස්ථාන භූමියේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එහිදි පහත සේවාවන් ජනතාව වෙත සැපයීමට අපේක්ෂිතය

- විවාහ, ජාතික හැඳුනුම්පත්, උප්පැන්න සහතික, රියදුරු බලපත්‍ර නොමැති අය සඳහා ඒ හා සම්බන්ධ මූලික කටයුතු සිදු කිරීම.
- ආයුර්වේද වෛද්‍ය සායනය, ඖෂධ පැන් ලබා දීම.
- බෝ නොවන රෝග නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ දේශනය, වකුගඩු රෝග පරීක්ෂාව හා උස බර මැනීම, රුධිරයේ සීනි පරීක්ෂාව, දන්ත සායනය, අක්ෂි පරීක්ෂාව (දංකොටුව ප්‍රාදේශීය රෝහල මගින්)
- ක්‍රීඩා සමිති වෙත ක්‍රීඩා උපකරණ සහ මරණාධාර සමිති වෙත සුදු කොඩි බෙදා දීම.

- ජනතාවගේ පානිය ජල ගැටළු රැස් කිරිම

- පැළ වර්ග බෙදා දීම.

- කඩදාසි හා රෙදි බෑග් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන

- කොම්පෝස්ට් අලෙවිය

- වැසිකිලි ආධාර,නිවාස ආධාර සහ ස්වයං රැකියා උපකරණ ලබා දීම, පරිසර ගැටළු, විදුලි ගැටළු, මාර්ග නඩත්තුව සම්බන්ධ ගැටළු විසදීම හා ප්‍රාදේශීය සභාව සම්බන්ධ වෙනත් සේවාවන් ජනතාව වෙත සැපයීම

vii. පළාත් පාලන සේවා තරගය විනිශ්චය සඳහා 2018.09.27,28 දෙදින වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පැමිණීමට නියමිතය.

පහත සඳහන් කාර්ය ස්ථාන එම තරගය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

- කිරිමැටියාන මහජන පුස්තකාලය - 11 ශ්‍රේණිය
- වෙන්නප්පුව මහජන පුස්තකාලය - 111 ශ්‍රේණිය
- බුජ්ජම්පොල මහජන පුස්තකාලය - ශ්‍රේණිගත නොවු
- කටුකෙන්ද සමාධි පෙර පාසල
- කිරිමැටියාන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය
- වෙන්නප්පුව වෙළඳ සංකිර්ණය
- වෙන්නප්පුව සතිපොල
- හොදම කර්මාන්තය - රොටරි පාර තාර දැම්ම
- වෙන්නප්පුව පෙරටු කාර්යාලය
- කිරිමැටියාන උපකාර්යාලය
- දංකොටුව පවිත්‍ර නගරය
- යෝගියාන ආදාහනාගාරය

viii. බල ප්‍රදේශයේ මන්ත්‍රි කොට්ඨාස 25 ම ආවරණය වන පරිදි තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් වෙත නිවාස ආධාර, ස්වයං රැකියා ආධාර බෙදා දිමේ වැඩසටහන ඉදිරි දින වල පැවැත්විමට නියමිතව ඇත.

ix. ගොඩනැගිලි ඉදිකිරිමට හා ප්‍රතිසංස්කරණය කිරිමට අදාල ඇස්තමේන්තු 36 ක් අනුමත කර ඇත. එයින් මේ වන විට 15 ක් සම්පුර්ණයෙන් නිම කර ඇත.

x. බල ප්‍රදේශයේ මාර්ග අලුතින් ඉදිකිරිමට අදාල වැඩ විෂයන් 86 ක ඇස්තමේන්තු මේ වනිවිට අනුමත කර ඇති අතර, එයින් වැඩ විෂයන් 42 ක් මේ වන විට වැඩ අවසන් කර ඇත.

xi. සභාවේ වැඩ ඒකක මගින් ප්‍රිමික්ස් කිරිම හා මාර්ග දෙපස කැලය සුද්ද කිරිම ආදි මාර්ග නඩත්තු සේවා ක්‍රියාත්මක වෙමින් පවති..

xii. සභා බල ප්‍රදේශයේ විදි පහන් නඩත්තු කටයුතු කමිටු සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවති. දිවා කාලයේ දැල්වෙන වීදී පහන් සම්බන්ධයෙන් මන්ත්‍රිතුමාන්ලාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

xiii. මන්ත්‍රී කොට්ඨාස තුල පිහිටි සභාව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට අදාල යෝජනා සහ මාර්ග නම් කිරීමට අදාළ යෝජනා පසුගිය සභාවේදි ලබාදුන් ආකෘති පත්‍ර අනුව ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

xiv. බල ප්‍රදේශයේ කසළ කළමනාකරණ කටයුත තවදුරටත් වැඩිදියුණු විය යුතුව ඇත. ඒ සඳහා පරිසර කමිටු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය අපේක්ෂා කරමි. මාගේ ඉදිරි විදේශ සංචාරය තුලින්ද ඒ සඳහා ආධාර ලබා ගැනිමට අපේක්ෂා කරමි.

xv. 2019 අයවැය ලේඛනය හා 2019-2022 සිව් අවුරුදු සැලැස්ම සකස් කිරිම සඳහා මේ දක්වා යෝජනා ලබා නොදුන් මන්ත්‍රීතුමන් ඉදිරි සතිය අවසන් වීමට ප්‍රථම යෝජනා ලබා දෙන ලෙස දන්වමි.

xvi. 2018.08.15 දින සාහිත්‍ය තරගවල ජයග්‍රාහකයින් වෙත ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය සිදුකරන ලදි. ඊට අමතරව 2018 අගෝස්තු මාසය තුළ ළමා අපචාර වැළැක්විමට අදාල වැඩමුළුවක් පෙර පාසල් දෙමාපියන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි. එම වැඩසටහන සාර්ථක කර ගැනිමට සහයෝගය ලබාදුන් ප්‍රජා සංවර්ධන කමිටුවේ ගරු සභාපතිතුමාට, මන්ත්‍රීතුමන් සහ මන්ත්‍රීතුමියන්ට හා කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාට ස්තුතිය පුද කර සිටිමි.

xvii. දැනට පවත්නා වියළි කාලගුණ තත්වය තව දුරටත් වැඩිවුවහොත් ප්‍රදේශයේ ජල හිඟයක් ඇති විය හැකිය. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කර ඒ සඳහා වැඩසටහන් සැලැසුම් කර ගැනිමට සියලුම මන්ත්‍රීතුමන්ගේ සහයෝගය ඉල්ලා සිටිමි.

xviii. සභාවේ කටයුතු කළමනාකරණය කරන සංවර්ධන නිලධාරින්ගේ හා කළමනාකරණ සහකාර නිලධාරින්ගේ හිඟයක් පවතින බැවින්, සමහර වැඩ විෂයන් වල යම් ප්‍රමාදයක් සිදුවි ඇත. එම පුරප්පාඩු පුරවා ගැනිම සඳහා විෂය භාර අමාත්‍යවරයා වෙත හා පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලිම ඉදිරිපත් කර ඇත. එසේ වුවද ගත වු මාස 05 ක කාලය තුළ සෑම අංශයකම විශාල ප්‍රගතියක් අත්කර ගැනිමට හැකි විය. ඒ සඳහා සහයෝගය ලබාදුන් කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාටත් කමිටු සභාපතිතුමන් ඇතුලු ගරු මන්ත්‍රීවරුන් වෙතත් ස්තුතිය පුදකර සිටිමි.

xix. පාර්ලිමේන්තු ගිණුම්කාරක සභාවේ ඇගයීමට ලක් වු දිවයිනේ පළමු රාජ්‍ය ආයතන අතරට වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවද ඇතුලත් වී ඇගයිමට ලක් වී ඇත. ඒ සඳහා කැපවීමෙන් කටයුතු කල සියලුම දෙනා වෙත ස්තුතිය පුද කර සිටිමි.

**03. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ - නැත**

**04. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපතිතුමාගේ යෝජනා**

04 : 01 සේවා ගිවිසුම් පදනම මත සේවය බඳවා ගත් සේවකයින් 20 දෙනෙකුගේ ගිවිසුම් කාලය දිර්ඝ කිරිම සඳහා අනුමැතිය ලබා ගැනිමට අදාල යෝජනාව.

| නම | තනතුර | ගිවිසුම් කාලය දිර්ඝ කළ යුතු කාලය |
|---|---|---|
| 01.ආර්.එම්.කුමාරසිංහ මයා | සෞඛ්‍ය කම්කරු | 2018.09.02 දින සිට 2019.03.01 |
| 02. ඒ.පි.ඩි. ප්‍රියංකර පෙරේරා මයා | සෞඛ්‍ය කම්කරු | 2018.05.10 දින සිට 2018.11.09 |
| 03.ආර්.කේ. දිලිප් මයා | සෞඛ්‍ය කම්කරු | 2018.05.10 දින සිට 2018.11.09 |
| 04.එම්.පි.ඒ. කුමාර මයා | සෞඛ්‍ය කම්කරු | 2018.05.10 දින සිට 2018.11.09 |
| 05.එස්.රාජේන්ද්‍ර මයා | සෞඛ්‍ය කම්කරු | 2018.09.02 දින සිට 2019.03.01 |
| 06.එල්.ඩබ්. ජගත් අයිසෙක් ද මෙල් මයා | සෞඛ්‍ය කම්කරු | 2018.09.02 දින සිට 2019.03.01 |
| 07.ආර්. කමන් කුෂාන්ත මයා | සෞඛ්‍ය කම්කරු | 2018.09.02 දින සිට 2019.03.01 |
| 08.ආර්.රගුවර් මයා | සෞඛ්‍ය කම්කරු | 2018.09.02 දින සිට 2019.03.01 |
| 09.එම්.එම්. ශෂිකලා දිල්රුක්ෂි මිය | පුස්.සහයක | 2018.10.30 දින සිට 2019.04.29 |
| 10.එම්.එම්. කේ. චන්දිමා මිය | පුස්.සහයක | 2018.10.30 දින සිට 2019.04.29 |
| 11.ජේ.විලානි ජයකොඩි මිය | පුස්.සහයක | 2018.10.30 දින සිට 2019.04.29 |
| 12.ඒ.එම්. සසික තිළිණ මයා | වැඩකම්කරු | 2018.09.26 දින සිට 2019.03.25 |
| 13.එන්.පි.ආර්. ප්‍රදිප් කුමාර මයා | වැඩකම්කරු | 2018.09.26 දින සිට 2019.03.25 |
| 14.අයි.එච්. මිලාන් කුමාර මයා | වැඩකම්කරු | 2018.10.20 දින සිට 2019.04.19 |
| 15.ඩබ්.කේ.ඒ.එම්.කේ.මධුභාෂිණි මිය | වැඩකම්කරු | 2018.09.09 දින සිට 2019.03.08 |
| 16.ඒ.පි.පි.ඩි. ජයලාල් මයා | රියදුරු | 2018.10.03 දින සිට 2019.04.02 |
| 17. ඩී.ඒ. සනත් ඉන්දික මයා | රියදුරු | 2018.10.03 දින සිට 2019.04.02 |
| 18.ආර්.එස්. දුෂ්යන්ත ප්‍රනාන්දු මයා | රියදුරු | 2018.10.03 දින සිට 2019.04.02 |
| 19.ජේ.ඒ. සංජිව පද්මසිරි මයා | රියදුරු | 2018.10.03 දින සිට 2019.04.02 |
| 20.කේ. තුෂාන් මංජුල මයා | රියදුරු | 2018.10.03 දින සිට 2019.04.02 |

සේවා ගිවිසුම් පදනම මත සේවය බඳවා ගත් සේවකයින් 20 දෙනෙකුගේ ගිවිසුම් කාලය දිර්ඝ කිරිම සඳහා අනුමැතිය ලබා ගැනිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

04:02 උසස්වීම් ලබා සේවයෙන් ඉවත් වූ පුස්තකාල සහයක දෙදෙනා වෙනුවට සේවා ගිවිසුම් පදනම මත පුස්තකාල සහයක දෙදෙනෙකු බඳවා ගැනිමට අදාල යෝජනාව

උසස්වීම් ලබා සේවයෙන් ඉවත් වූ පුස්තකාල සහයක දෙදෙනා වෙනුවට සේවා ගිවිසුම් පදනම මත පුස්තකාල සහයක දෙදෙනෙකු බඳවා ගැනිමට අදලා යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

04:03 2018.08.29 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා තීරණ පරිදි පරිසර සංරක්ෂණ හා පැමිණිලිවලට පිළිතුරුපත් විධිමත්ව හා අප්‍රමාදව ප්‍රතිලාභින් වෙත සපයා දිමට ප්‍රජා සංවර්ධන අංශයට පරිගණකයක්, මුද්‍රණ යන්ත්‍රයක්, පරිගණක ක්‍රියාකරු පුහුණු ලාභියකු ලබා ගැනිම හා වෙන්නප්පුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සඳහා අධි ශීතකරණයක් හා වානේ අල්මාරියක් ලබා දිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා කතා කරමින්, පරිසර කමිටුවේ කාර්යයන් පුළුල් කිරිමේදී පැන නැගෙන ගැටළු සම්බන්ධව හා පරිසර කමිටුවේ කටයුතු කරගෙන යාමට නිලධාරියකුගේ අවශ්‍යතාවය පිළිබඳ පැහැදිලි කරන ලදි. පරිසර පැමිණිලි සම්බන්ධව කටයුතු කිරිමේදී විශාල වශයෙන් ලිපි යැවිමට සිදුවන බවත් පරිසර කමිටු කාර්යයන් වේගවත් කිරිම සඳහා මානව සම්පත් දෙමින් පරිසර කමිටුවේ කාර්යයන් නිසි පරිදි ඉටු කිරිමට සහය වන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා ගරු සභාපතිතුමාගේ පැහැදිලි කිරිමෙන් අනතුරුව යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04:04 ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රිඩාංගනය සඳහා ඉඩම් කොටසක් මිලදි ගැනිම පිළිබඳ තීරණයක් ගැනිම.

ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රිඩාංගනය සඳහා ඉඩම් කොටසක් මිලදි ගැනිම පිළිබඳ තීරණයක් ගැනිම සම්බන්ධ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදි.

අංක 6131 පිඹුරේ අංක 01 හි සඳහන් පර්චස් 48.7 ක් ඉඩම් කොටස ප්‍රාදේශිය සභාව වෙත වෙළඳපල වටිනාකමට විකිණිමට කැමති බවත් ප්‍රැබ්බෝනියා මාවත හා ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රිඩාංගනය ඇතුළුවන සභාවට අයත් මාර්ගය යා කෙරෙන පරිදි පිඹුරු අංක 12682 කැබලි අංක 04 දරණ ඉඩම් කොටසෙන් කිසිදු බිම් ප්‍රමාණයක් ලබා දිමට හැකියාවක් නොමැති බවත් ඉඩම් හිමිකරු විසින් ලිඛිතව දැනුම් දි ඇති බවත් ඒ අනුව පර්චස් 48.7 ක් ඉඩම් කොටසට අමතරව මාර්ග දෙක යාවන ලෙස 12682 අංක කැබලි 04 ඉඩමෙන් අවම වශයෙන් අඩි 15 ක බිම් තීරයක් පර්චස් 06 ක පමණ අත්‍යවශ්‍ය බැවින් එම කොටස පවරා ගැනිමට කටයුතු කල යුතු බවට ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා කථා කරමින්, ඉඩම් හිමියා සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනිමට කටයුතු කළ යුතු බව පැහැදිලි කරන ලදි.

ගරු මන්ත්‍රී යූ. ජුඩ් උඩුගම්පල මහතා කථා කරමින්, අවස්ථා ගණනාවකදී මෙම ඉඩමෙන් කොටස් ඇල්බට් පිරිස් ක්‍රීඩාංගනයට ලබාගෙන ඇති බවත්, පර්චස් 48.7 ක කොටස ලබා දීමට ඉඩම් හිමියා කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර සාධාරණ මිලක් ලැබෙන්නේ නම් අඩි 15 ක මාර්ගය සඳහා ඉඩම් කොටස ලබා දීම දෙවනුව සළකා බලා මාර්ගය පුළුල් කිරීම සඳහා සහයෝගය ලබා දීම කල ඇති බව ඉඩම් විවධ ප්‍රකාශ කර බවත්, මේ අවස්ථාවේ පර්චස් 48.7 ක බිම් ප්‍රමාණය ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බව අදහස් දක්වන ලදි.

රජයේ තක්සේරුව ලබාගෙන තීරණයක් ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ. ජුඩ් උඩුගම්පල මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව එම යෝජනාව සභා සම්මත විය.

04.05 තාමරකුලිය විහාරස්ථානයේ දැනට ඉදිවෙමින් පවතින දෙමහල් දහම් පාසල් ශාලාවේ ඉතිරි වැඩකටයුතු නිම කරගැනීම සඳහා උළුවහු, දොර ජනෙල් හා බාල්ක සඳහා දැව සපයා ගැනීම වෙනුවෙන් තාමරකුලිය, මැටිකොටුව පොදු සුසාන භූමියේ තිබෙන තේක්ක ගස් අතරින් තේක්ක ගස් 05 ක් ලබා දීම පිළිබද තීරණයක් ගැනීම.

තාමරකුලිය විහාරස්ථානයේ දැනට ඉදිවෙමින පවතින දෙමහල් දහම් පාසල් ශාලාවේ ඉතිරි වැඩකටයුතු නිම කරගැනීම සඳහා උළුවහු, දොර ජනෙල් හා බාල්ක සඳහා දැව සපයා ගැනීම වෙනුවෙන් තාමරකුලිය, මැටිකොටුව පොදු සුසාන භූමියේ තිබෙන තේක්ක ගස් අතරින් තේක්ක ගස් 05 ක් ලබා දීම පිළිබද තීරණයක් ගැනීම පිළිබද ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදි.

ගස් ප්‍රමාණය නොව අවශ්‍යතාවය මත අවශ්‍ය ලී ප්‍රමාණය ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ අනුව ප්‍රමාණාත්මකව අවශ්‍ය ගස් ප්‍රමාණය ලබා දීම සඳහා ගරු මන්ත්‍රී ඒ.එස්.එම් .කිත්සිරි අභයවික්‍රම මහතා පැහැදිලි කරන ලදි.

ලබාදෙන ගස් ප්‍රමාණය තක්සේරු කර වටිනාකම ලබාගැනීමේ අවශ්‍යතාවය ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා පැහැදිලි කරන ලදි.

අවශ්‍යතාවය සොයා බලා ඒ අනුව අවශ්‍ය ගස් ප්‍රමාණය ලබා දීමට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කළ අතර, එම යෝජනාව ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

04.06 වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සේමනේරියන් වත්ත නිවාස ක්‍රමයේ අනවසරකරුවන් නියමාණුකූල කිරීමට අදාල යෝජනාව.

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සේමනේරියන් වත්ත නිවාස ක්‍රමයේ අනවසරකරුවන් නියමාණුකූල කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය

04.07 2018 ජුලි 19 සිට 29 බහරේන් හි පැවැත්වෙන ආසියානු කණිෂ්ඨ වොලිබෝල් තරඟාවලිය 2018 සඳහා වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලයේ ඉගෙනුම ලබන යූ.ඩබ්. සයුරු කණිෂ්ඨ ශිෂ්‍යාට විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව රු.15,000/- ක ආධාර මුදලක් ප්‍රධානය කිරිම පිළිබඳ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

04.08 2018/09/04 සිට 2018/09/16 දක්වා ස්පාඤ්ඤයේ පැවැත්වෙන 2018 ප්‍රවීණයන්ගේ ලෝක මළල ක්‍රීඩා තරඟාවලිය සඳහා පුත්තලම් දිස්ත්‍රික්කය නියෝජනය කරමින් සහභාගිවන ඩබ්.එස්.එස්.ඩී.සී. ඇග්නස් ක්‍රිඩිකාව වෙත විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව රු.15,000/- ක මුදලක් ප්‍රධානය කිරිම පිළිබඳ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

04.09. 2018/06/24 සිට 2018/06/30 දක්වා බංගලාදේශයේ ඩකා නුවර පැවැත් වූ BKSP අන්තර් ජාතික හොකී තරඟාවලිය සඳහා වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලය නියෝජනය කරමින් එයට සහභාගී වූ ඩබ්.එස්. රමාල් හාතිය ද අල්විස් සිසුවාට රු.15,000/- ක මුදලක් ප්‍රධානය කිරිම පිළිබඳ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පදිංචි ශිෂ්‍යන් ද යන්න සනාථ කර ගැනිමෙන් පසුව ආධාර මුදල් ලබාදිම සුදුසු බවත්, මෙම යෝජනාවට අදාල මුදල් ලබාදිමට කටයුතු කිරිම සුදුසු බවත් මෙයට පසුව ඉදිරිපත් කරන යෝජනා වලදී පදිංචි බල ප්‍රදේශය තහවුරු කරගෙන ආධාර මුදල් ලබාදිම සුදුසු බවට ගරු මන්ත්‍රි යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රි ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා කථා කරමින්, බල ප්‍රදේශයේ පදිංචි සිසුවෙක් නම් පමණක් ආධාර මුදල් ගෙවිම සඳහා අනුමැතිය ලබා දිය හැකි බැවින්, පදිංචිය තහවුරු කරන ලෙසට දන්වා සිටින ලදි.

ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතාගේ හා ගරු මන්ත්‍රි ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පෙ.ව.10.45 සිට පෙරවරු 11.15 දක්වා තේ පැන් සංග්‍රහය සඳහා සභාව කල් තබන ලදි.

04.10 එකම සේවා ස්ථානයක වසර පහකට අධික කාලයක් සේවය කර ඇති සියලුම සේවක මහත්ම මහත්මින් නව තාවයකින් සේවය කිරිම සඳහා සේවයේ අවශ්‍යතාවය මත නව සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරිම සුදුසු යැයි ගරු මන්ත්‍රි යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

04.11. උඩාසිරිගම කොට්ඨාසයේ උ/සිරිගම්පල ග්‍රාම නිලධාරි වසමේ රෝයල් පාර්ක් ඉඩමේ පළමු පාරේ පදිංචිකරුවන් විසින් එම මාර්ගය " ශ්‍රී ජය මාවත " නමින් නම් කරන ලෙසට වූ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** කාරක සභා වාර්තා සළකා බැලිම

**01. 2018.08.01** දින පැවති පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රිනි ජී. ලීනා ප්‍රියන්ගිකා පෙරේරා මහත්මිය විසින් ස්ථිර කිරිමෙන් වාර්තාව සභා සම්මත විය.

**02. 2018.08.23** දින පැවති ක්‍රීඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීමේ කාරක සභා වාර්තාව

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවටගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ඒ. රෙක්සි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කිරිමෙන් වාර්තාව සභා සම්මත විය.

**03. 2018.08.07** දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව
**04. 2018.08.21** දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තා සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඩබ්.ඒ. රෙන්ප්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කිරිමෙන් වාර්තාව සභා සම්මත විය.

**05. 2018.08.02** දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැගිලි කාර්මික සේවා කාරක සභා වාර්තාව
**06. 2018.08.16** දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැගිලි කාර්මික සේවා කාරක සභා වාර්තාව

ගරු මන්ත්‍රී එම්.පි.ඩි. උදේෂ් තරංග කරුණාරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා 02 ක් පිළිබඳ විමසන ලද අතර, ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා හා කාරක සභා සභාපති ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් පැහැදිලි කිරිම ඉදිරිපත් කරන ලදි.

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තා සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රිනි අයි. නයෝමි රම්‍යලතා මහත්මිය යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා විසින් ස්ථිර කිරිමෙන් වාර්තාව සභා සම්මත විය.

**07. 2018.08.23** දින පැවති සංවර්ධන උපදේශන කාරක සභා වාර්තාව

ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා හා ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා කථා කරමින්, වෙන්නප්පුව වෙළඳ සංකිර්ණයේ උඩුමහල ප්‍රයෝජනයට නොගෙන කිසිදු ආදායමක් නොමැතිව නිකරුනේ පැවතිම විශාල පාඩුවක් බවත්,එයින් සභාවට ආදායමක් ලැබෙන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතු බවටත් අදහස් දක්වන ලදි.

ගරු සභාපතිතුමා කථා කරමින්, වෙන්නප්පුව වෙළඳ සංගමය සමඟ සාකච්ඡා කර තීරණයක් ලබා දෙන බව ප්‍රකාශ කරන ලදි.

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**08. 2018.08.02 දින පැවති විශේෂ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව**

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**09. 2018.08.29 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව**

ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා කථා කරමින්, වාර්තාවේ සඳහන් පරිදි කොම්පෝස්ට් අලෙවිය සඳහා වාහනයක් ලබා ගැනීම අසිරු බව යන්න සඳහන් කිරීම පිළිබඳ ප්‍රශ්න කරන ලදි.

ගරු කාරක සභා සභාපති ගැටළුව ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් එම ගැටළුව හා ඊට ලබාදුන් විසඳුම් පැහැදිලි කරන ලදි. ඉදිරි වියළි කාලගුණ තත්වයට මුහුණු දීම සඳහා අවශ්‍ය වුවහොත් ජල බවුසරයක් කුලියට ගැනීම කළ යුතු බවට සභාව දැනුවත් කරන ලදි. වෙන්නප්පුව හා දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ජල බවුසරයක් ලබාගත හැකි බැවින්, කුලියට ගැනීමේ අවශ්‍යතාවයන් පැන නොගෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා කථා කරමින්, ජල බවුසර් නොව ජල ටැංකි, ස්ථානගත කිරීම පිළිබඳ සොයා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සඳහා අංග සම්පූර්ණ කොම්පෝස්ට් අංගනයක් ඉදිකර දීමට මෙගාපොලිෂ් ආයතනය කටයුතු කරන බව දන්වා ඇති බැවින්, කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා දන්කොටුව රොටරි ඉඩම ලබා ගැනීමේ කටයුතු කඩිනම් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු සභාපතිතුමා විසින් දන්කොටුව රොටරි ඉඩම ලබා ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමග සම්බන්ධ වී කටයුතු කරන ලෙසට කාරක සභා සභාපති ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා වෙත හා ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා වෙත දන්වා සිටින ලදි.

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**10. 2018.08.30 දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව**

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී එච්.ඒ. සී.පෝල් පෙරේරා මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී එස්.එම්. දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**06 . ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරිමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සළකා බැලිම**

01. මාසික ඒකාබද්ධ ලැබිම් සාරාංශ - 2018 ජූලි
02. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශ - 2018 ජූලි

ඉදිරිපත් කර ඇති වාර්තා සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කළ අතර, ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා විසින් ස්ථිර කිරිමෙන් වාර්තාව සභා සම්මත විය.

**07. වෙනත් කරුණු හා අදහස් ඉදිරිපත් කිරිම**

ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ලුණුවිල සිරිගම්පල සතිපොල භූමියේ අයිතිය පිළිබඳ ගැටළුවක් සම්බන්ධව ප්‍රකාශ කරන ලදි. ලුණුවිල සතිපොල භූමිය දැනටමත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත අයිතිය පවරන බවත්, සමුපකාරය පිහිටි ඉඩම් කොටස වෙන්කර ඇති අතර, ඉතිරි කොටස් ලුණුවිල සතිපොල සඳහා වෙන්කර ඇති බවත්, නිත්‍යානුකූල අයිතිය නොලැබිම හේතුවෙන් සතිපොල දියුණු කිරිමට හැකියාවක් නොමැති බවත්, පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා සභාපතිතුමා වෙත අවධානය යොමු කරමින් මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගැනිමට අවශ්‍ය කටයුතු කරන ලෙස සභාව දැනුවත් කරන ලදි.

මේ සම්බන්ධව කාර්යාලය මගින් ලිපි කිහිපයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නිකුත් කර ඇති බවත්, එම ආයතනය මගින් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකර ඇති බවත් අදාල වාර්තාව කඩිනමින් යොමු කරන බව දන්වා එවා ඇති බවත් පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා සභාපති ගරු මන්ත්‍රී යූ. ජුඩ් උඩුගම්පල මහතා පැහැදිලි කරන ලදි.

සභාවට අයිතිය ඇති ඉඩම්වල අයිතිවාසිකම් පිළිබඳ තහවුරු කර ගැනිම කඩිනමින් කල යුතු බව ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා සභාව දැනුවත් කරන ලදි.

ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කථා කරමින් පසුගිය දින වෙන්නප්පුව ජනතාවට මුහුණ දිමට සිදු වූ සිදුවීමක් පිළිබඳ සභාව දැනුවත් කරන ලදි.

පසුගිය දින ජනබල මෙහෙයුමට සහභාගි වූ වෙන්නප්පුව ප්‍රදේශයේ ජනතාව දැඩි ආසාත්මිකතාවයට ලක් වූ බවත්, එමගින් ජනතාව පත් වූ අසිරුතාවය පිළිබඳ එයට හේතු කිරිපැකට් පෙන්වමින් සභාව දැනුවත් කරන ලදි. කොළඹ කොටුව පොලිස් බල ප්‍රදේශයට අයත් බෝධිය ඉදිරිපිට දී මෙම කිරි පැකට් බෙදූ බවත් මේ පිළිබඳව 2018.09.10 දින කොළඹ කොටුව පොලිස් ස්ථානයේ අංක CIB 286/97 යටතේ පැමිණිලි කල බවත්, ප්‍රකාශ කරන ලදි. ජාතික ලොතරැයි මණ්ඩලයට අයත් WP-ND-3094 අංක දරණ වෑන් රථයෙන් බෙදා හරින ලද මෙම කිරිපැකට් වල කල් ඉකුත් වීමේ දිනය 2018.10.26 දින බවත් නිෂ්පාදිත දිනය 2018.08.27 දින බාණ්ඩ අංකය 11/31HI/PV/6 බවත් වගකිමෙන් යුතුව ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි.

කිරි පැකැට්ටුව ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කරමින් වෙන්නප්පුව මහජන සෞඛ්‍ය පරික්ෂක වෙත ඉදිරිපත් කර එහි අඩංගු විෂ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කථා කරමින්, මේ ආසාධිත රෝගීයාව වෛද්‍ය පරික්ෂණයකට යොමු කර පරික්ෂණ වාර්තාවක් සමඟ අධිකරණයට ඉදිරිපත් කිරිම මිස මෙය සභාවට ඉදිරිපත් කිරිම නොගැලපෙන බවට අදහස් දක්වන ලද අතර, ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා කථා කරමින්, 2018.09.05 දින බෙදන ලද කිරි පැකට්ටුව 2018.09.13 දින තෙක් ළඟ තබාගෙන ඉදිරිපත් කිරිමෙන් පසුව පරික්ෂණ වාර්තාවක් ලබා ගැනිම සුදුසු නොවන බවට අදහස් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.ඩී. උදේෂ් තරංග කරුණාරත්න මහතා කථා කරමින්, කිරි පැකට් සඳහා කිසිවකු විසින් විෂ එකතු කර ඇත්නම් එම සිදුවිම හෙලා දකින බවට අදහස් ප්‍රකාශ කරන ලදි.

නැ/නයිනමඩම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පිංවත්ත ඉඩම දිගින් දිගටම ගංවතුරෙන් යටවන බවත්, මෙම ඉඩම වෙන්දේසි කර කට්ටි කර ඇති බවත්, මේ සඳහා සභා අනුමැතියක් ලබා දි ඇත්තේ කෙසේද යන්න විමසන ලදි.

මේ සම්බන්ධයෙන් පසුව වාර්තා කරන බව ගරු සභාපතිතුමා දන්වා සිටින ලදි.

ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කථා කරමින්, දේශපාලන පක්ෂ වල පැරණි සිදුවිම ගැන කථා කිරිම එලක් නොවන බවත්, අනාගතය ගැන වෙන්නප්පුව ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා, ඔවුන්ගේ අනාගතය පිළිබඳ සිතා කටයුතු කල යුතු බවට ප්‍රකාශ කරන ලදි.

කිරි පැකට් පානය කිරිමෙන් ජනතාව ආසාත්මිකතාවයට ලක්විම පිළිබඳ අධිකරණ ක්‍රියාමාර්ගයකට මිස සභාව වෙත ඉදිරිපත් කර මහජන සෞඛ්‍ය පරික්ෂණ වාර්තාව ලබා ගැනිම පිළිබඳ ප්‍රශ්න කරන ලදි.

ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පිළිතුරු දෙමින් පළමු පියවර ලෙස අධිකරණ ක්‍රියා මාර්ග ආරම්භ කර ඇති බවත්, ප්‍රදේශයේ ජනතාවට බලපා ප්‍රශ්නයක් බැවින් දෙවන පියවර ලෙස සභාවට ඉදිරිපත් කර ඇති බවත් පැහැදිලි කරන ලදි.

ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කථා කරමින්, බෝලවත්ත, කිරාගාර මාර්ගයේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මාර්ගයකට යාබදව තාප්පයක් ඉදිකිරිම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා හා ලේකම්තුමා දැනුවත් කල නමුත් මේවන විට තාප්පය ඉදිකර අවසන් බවත්, ප්‍රකාශ කරන ලදි. මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ කිසිදු නිර්දේශයක් හෝ දැනුවත් කිරිමකින් තොරව අනුමැතිය ලබා ඉදිකරන ලද තාප්පය සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද දැයි ගරු සභාපතිතුමාගෙන් විමසන ලදි.

ලේකම්තුමාගේ තොරතුරු දැන ගැනිම සඳහා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ලේකම්තුමා කථා කරමින්,ඉදිරිපත් කර ඇති අයදුම්පත්වලට අනුව තාක්ෂණ නිලධාරි විසින් පරික්ෂා කර වාර්තාවක් ලබාදි තිබු බවත්, ඒ අනුව ඉදිකිරිමට අවසරය ලබාදුන් බවත් එහිදි එම මාර්ගය පළාත් සභා මාර්ගයක් ලෙසට වාර්තා කළ නොතිබු බවත් එය කාර්යාලයේ අඩුපාඩුවක් ලෙස දකින බව ප්‍රකාශ කරන ලදි. ඕනෑම පුද්ගලයකුට වන්දි විරහිත ගිවිසුමක් යටතේ තම ඉඩමේ තාප්පයක් ඉදිකිරිමට හැකියාවක් ඇති බවත් එය කිසිවකුට බැහැර කර නොහැකි බව මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාර්ගයක් බව දැනගත් පසුව එය අත්හිටුවිමට කටයුතු කර අදාල නිර්දේශ ලබාගත් බව පැහැදිලි කරන ලදි

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත මහ සභා අවස්ථාවක් බවට පත්කරන ලදි.

ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කතා කරමින්, බොරලැස්ස තිඹිරවැව මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කළහොත් මාර්ගය බොල්වන බව වයඹ ඉංජිනේරු මහතා විසින් ප්‍රකාශ කළ බැවින්, එබැවින් මාර්ගය කොන්ක්‍රීට් කරන ලෙස ඉල්ලා සිටින ලද අතර, එමෙන්ම බොරලැස්ස කොස්ගහවත්ත ජනපදයේ ජනපදයේ පන්සල ඉදිරිපිට මාර්ගය ගිංඔය රක්ෂිතයට අයත් බවත්, එම මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය නොකර කොන්ක්‍රීට් කිරීම සහා අරමුදල් අපතේ යාමක් බවත් සභාව දැනුවත් කරන ලදි.

ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය කථා කරමින්, වසර 3 කට අධික කාලයක් ආර්ථික කටයුතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ බොරලැස්ස ග්‍රාමය අතිවිශාල සංවර්ධනයක් සිදුකර බවත්, ගරු සභාපතිතුමා ලබාදුන් ප්‍රතිපාදන මත ප්‍රෙද්ශයේ මහ මාර්ග 02 ක් යෝජනා කර සම්මත වූ බවත්, තාක්ෂණ නිලධාරින් විසින් 02 වරක් මාර්ග පරික්ෂා කර ඇස්තමේන්තුව සකස් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කතා කරමින්, බොරලැස්ස කොස්වත්ත ජනපදයේ මාර්ගය සකස් කිරීම පිළිබඳ විරුද්ධත්වයක් ප්‍රකාශ නොකල බව සභාව දැනුවත් කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා කථා කරමින්, වෙන්නප්පුව ජෝන් පෝල් ජාත්‍යාන්තර පාසල ආරම්භ කර වසර 05 ක් පිරීම නිමිත්තෙන් 2018.10.30 දින පැවැත්වෙන පා ගමන සඳහා පාසලට ඇතුල්වන මාර්ගය සකස් කර දෙන ලෙස ගරු අධ්‍යක්ෂ පියතුමා ඉල්ලීමක් කර ඇති බැවින්, ඒ අනුව එම මාර්ගය ප්‍රිමික්ස් දමා සුදුසු පරිදි සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රිඩාංගනය සඳහා මුදල් ලබා ගැනීම ප්‍රධාන කාර්යාලයෙන් කරන ලෙස ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා ද ප්‍රකාශ කර ඇති බවත්, එහෙත් මේ වන තෙක් එය ක්‍රියාත්මක වී නොමැති බවත්, ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රිඩාංගනයේ දූෂණ කටයුතුවලට ඉඩ නොදෙන ලෙස නිරතුරුවම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදි.

කිරිමැටියාන කොම්පෝස්ට් අංගනයේ සෙනසුරාදා දින බිල්පත් නිකුත් කිරීමකින් තොරව පොහොර අලෙවි කරන බවට චෝදනා එල්ලවන බැවින්, ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා වෙතින් ඉල්ලා සිටින ලදි.

වෙන්නප්පුව පොලිස් ස්ථානාධිපති, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම්, ප්‍රදේශයේ ගරු පියතුමාන්ලා හා ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රිවරියන් සමඟ සිදුකල මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා වෙත හා ගරු අමාත්‍ය නිරෝෂන් පෙරේරා මැතිතුමා වෙත ස්තූතිය ඵල කරන ලදි.

නයිනමඩම ප්‍රදේශයේ හණතොටුපල හන්දිය රූබී ලී බඩු වෙළඳසැල පිටපස පැවති ''ජාන්ජම් කුලම්'' වැව හෙවත් ''ඕළුවැව'' මේ වන විට දක්නට නොමැති බවත්, පුද්ගලයන් කිහිප දෙනෙක් විසින් එය ගොඩ කර ඇති බවත්, ඒ හරහා පැවති ඇල මාර්ගය වැසී ඇති බැවින් වර්ෂා ජලයෙන් ප්‍රදේශයේ බොහෝ ස්ථාන යටවන බවත්, ඒ පිළිබඳ සොයා බලන ලෙසට ගරු සභාපතිතුමා දැනුවත් කරන ලදි.

පොතුටවටන පන්සල පිටුපස සූකර ගොවිපල ධම්මික රාජපක්ෂ යන අය විසින් බලපත්‍රයක් නොමැතිව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධිකරණ නඩුවක් ගොනුකර ඇති බවත්, 2017.08.11 දින ගොවිපල හිමිකරු විසින් වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව වෙතින් බලපත්‍රයක් ලබා ගැනිමට අයදුම්පත් භාරගැනිමේදී ඒ සඳහා පරිසර බලපත්‍රයක් ලබාගත යුතු බව පවසමින් අයදුම්පත භාරගෙන නොමැති බවත්, පරිසර

බලපත්‍රයක් ලබාගැනිමට යාමේදී ඒ සම්බන්ධයෙන් විරෝධතාවයක් පවතින් බැවින් බලපත්‍රය ලබා දී නොමැති බවත් ප්‍රකාශ කරන ලදි. නව ව්‍යාපාරිකයින් සඳහා මෙවැනි ක්‍රියා නොකරන ලෙසට ගරු සභාපතිතුමා වෙතින් ඉල්ලා ලදි.

වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව සතුව තිබු ගිනි නිවන ඒකකය නැවත ස්ථාපිත කිරිමට ඉල්ලා සිටින ලදි.

නයිනමඩම ක්‍රීඩා පිටිය පිළිබඳ ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා කරුණු විමසන ලදී.ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින් නයිනමඩම ක්‍රීඩා පිටියට අවශ්‍ය ඉඩම් පවරාගැනීමට යාමේදී ගොවිජන සේවා කාර්යාලයෙන් මතුකල ප්‍රශ්ණයක් මත එම කටයුතු නතර වි ඇති බවත්, තක්සේරු වාර්තාව ලබාගැනිමට යාමේදී ඔප්පුවේ කුඹුරු කොටසක නමක් සඳහන් වි ඇති බැවින් ගොවිජන සේවා කාර්යාලයෙන් නිර්දේශය ලබාගැනිමෙන් පසුව තක්සේරුව ලබාගෙන අවසන් වූ වහාම අදාල කටයුතු කරන බව පැහැදිලි කරන ලදි.

අංගම්පිටිය අංගම් ඇල හා අංගම්එඹ වසර 45 කට පසුව ප්‍රතිසංස්කරණය කිරිමට ගම්පෙරළිය වැඩසටහන මගින් කටයුතු සුදානම් කර ඇති බැවින්, මනත්තුරේ බෝක්කුව අඩි 10 ක පෙට්ටි බෝක්කුවක් ලෙසට සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

සෙන්දිරියාමුල්ල රොටරි ඉඩමේ ඉදිකිරිමට නියමිත කසල ප්‍රතිචක්‍රිකරණය මධ්‍යස්ථානය ගරු අමාත්‍ය චම්පික රණවක මැතිතුමාගේ ප්‍රතිපාදන මත ඉදිකිරිමට කටයුතු කර ඇති බව ප්‍රකාශ කරන ලදි.

දන්කොටුව නගර ශාලාවේ ඉතිරි වැඩ මෙගා පොලිෂ් වැඩසටහන යටතේ අවසන් කරන බවත්, වෙන්නප්පුව බස් නැවැතුම්පල ගොඩනැගිල්ල ඉදිකරන බවත් ප්‍රකාශ කරන ලදි.

ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා කථා කරමින්, කිරිමැටියාන කොම්පෝස්ට් අංගනයේ සෙනසුරාදා දිනවල බිල්පත් නිකුත් නොකර පොහොර විකිණීම පිළිබඳ කරන ලද චෝදනාව අනන්‍යතාවය තහවුරු වන පරිදි ඉදිරිපත් කරන ලෙසත් නැතහොත් සභාවේ කැපවිමෙන් සේවය කරන සේවකයන්ට එය බලපාන බවත් ප්‍රකාශ කරන ලදි.

ගිනි නිවන රථය අළුත්වැඩියා නොකර වෙන්දේසි කර විකුණා දැමිමට හේතු වූ කරුණු පිළිබඳව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා හා ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පැහැදිලි කරන ලදි.

ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කථා කරමින්,වෙන්නප්පුව බල ප්‍රදේශයේ ගිනිනිවිමේ කටයුතු සඳහා මීගමුව නගර සභාව සමඟ සම්බන්ධ වී එම කාර්යය කරගැනිමට කටයුතු කිරිම සුදුසු බවට අදහස් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී යු. ජුඩ් එම්මානුවෙල් මහතා කථා කරමින්, සභාවේ සේවකයින්ගේ නිලධාරින්ගේ චිත්ත ධෛර්යය පහළ වැටෙන ලෙස ප්‍රකාශ ඉදිරිපත් නොකරන ලෙසට සභාව දැනුවත් කරන ලදි.

ගරු මන්ත්‍රී සී.පි. සරත් වික්‍රමරත්න මහතා කථා කරමින්, පොතුවටවන සූකර ගොවිපල සම්බන්ධයෙන් එතුමා ස්ථාන පරික්ෂාවක් සිදුකල බවත් විශාල මුදලක් වැය කර එය ආරම්භ කර ඇති බවත්, සමාජයේ ඊරිෂ්‍යාව හා මුදල් නිසා මෙවැනි ගැටළු මතු වි ඇති බවත්, ගරු සභාපතිතුමාගේ සහභාගීත්වයෙන් ස්ථාන පරික්ෂාවක් සිදුකරන ලෙස කාරුණිකව ඉල්ලා සිටින බවත්, ප්‍රකාශ කරන ලදි.

මේ පිළිබඳ ලේකම්තුමාගෙන් විමසිම සඳහා ගරු මන්ත්‍රී සී.පි. සරත් වික්‍රමරත්න මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි. ලේකම්තුමා කථා කරමින් ගරු සභාපතිතුමා පත්විමට පෙර සම්පූර්ණ කළ යුතු වැඩකොටස්

කරන ලෙසට අදාල පුද්ගලයා දැනුවත් කළ බවත්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින්ද මෙය නතර කරන ලෙසට දැනුම් දි තිබු බවත්, පසුව නැවත සභාපතිතුමා විසින් දෙපාර්ශවය කැදවා සාකච්ඡා කිරිමෙන් පසුවත් එකඟතාවයකට එළඹීමට දෙපාර්ශවයටම නොහැකි වු බවත්, පැමිණිලිකරු වසරක පමණ කාලයක් බලා සිටිය බවත්, මේවන විට හෝ පරිසර බලපත්‍රය ලබාගැනිමට කටයුතු කරන්නේ නම් එය අධිකරණයට ඉදිරිපත් කළ හැකි බව ලේකම්තුමා පැහැදිලි කරන ලදි. ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත මහ සභා අවස්ථාවක් බවට පත් කරන ලදි.

මහ සභා රැස්වීම් ශාලාව තුළ ප්‍රදර්ශනය කල ඇත සමුහ ඡායා රූප අතරට 2002 වර්ෂයේ පත් වු මන්ත්‍රී මණ්ඩලයේ ඡායා රූපය තාක්ෂණය උපයෝගී කරගනිමින් සකස් කිරිමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා කථා කරමින්, 2019 වර්ෂය සඳහා සභාව සතු දේපල බදුදිම ඉදිරියේදී සිදුකළ යුතු බැවින්, සතිපොළවල් සම්බන්ධයෙන් ගෙන ඇති තීරණය දැනගත යුතු බව ප්‍රකාශ කරන ලදි.

ඔක්තොම්බර් මාසයේ පැවැත්වෙන මහ සභාවට අදාල විස්තර ඉදිරිපත් කිරිමට බලාපොරොත්තුවන බව ගරු සභාපතිතුමා දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඩි.ඒ. වර්ණරංග ගුණසේකර මහතා කථා කරමින්, වැව් ප්‍රතිසංස්කරණය සඳහා වයඹ පළාත් අමාත්‍ය ගරු සුමල් තිසේරා මැතිතුමා විසින් ප්‍රතිපාදන වෙන් කිරිම පමණක් සිදුකර ඇති බවත්, වැව් ගැඹුරු කිරිමේ කටයුතු සිදුනොකරන බව සභාව දැනුවත් කරන ලදි.

ගරු මන්ත්‍රී බි. ඇන්ටනි සුනිල් ශාන්ත පෙරේරා මහතා කථා කරමින්, වෙන්නප්පුව වෙළඳ සංකිර්ණයේ කඩ කාමරවල වාර්ෂික කුලිය පිළිබද ලැයිස්තුවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. ගරු සභාපතිතුමා කථා කරමින් මේවන තෙක් බදු මුදල් ගෙවා නොමැති කඩ කාමර සභාවට නැවත පවරා ගෙන ටෙන්ඩර් කිරිමට කටයුතු සුදානම් කරමින් පවතින බව ප්‍රකාශ කරන ලදි.

රමෝගා සිනමා ශාලාව ඉදිරිපිට ගොඩනැගිල්ල හා ලුණුවිල හංදියේ අසංක ප්‍රේන්ට් ආයතනය අසල ඉදිකිරමින් පවතිනෙ ගොඩනැගිල්ල පිළිබදව ප්‍රශ්න කරන අතර, මාර්ග සංවර්ධන අධිකාරියේ ගිවසුම් මත එම ඉදිකිරිම් කරගෙන යන බවත් මේ පිළිබද තව දුරටත් සොයා බලන බවත් ගරු සභාපතිතුමා විසින් පැහැදිලි කරන ලදි.

ඉතිහාසයේ පළමුවතාවට වායු සමනය කළ ගොඩනැගිල්ලක් තුළ මහ සභා රැස්වීමක් පැවැත්වීමට අද දින හැකි වු බවත් ඒ වෙනුවෙන් තම ශ්‍රමය කැප කළ සේවකයින්, නිලධාරින් හා බල ප්‍රදේශයේ මුතුන් මිත්තන් හා සිහිපත් කිරිමට සුළු මොහොතක් නැගිට සිටිමට අවස්ථාව ලබා ගනිමින් ප.ව 2.00 ට පමණ සභාවේ සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

කේ.වි. සුසන්ත පෙරේරා
සභාපති
වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව